සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது [All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

85 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ගෘහ ආර්ථික විද්‍යාව I, II
மனைப் பொருளியல் I, II
Home Economics I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

# ගෘහ ආර්ථික විද්‍යාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ධාන්‍යවල අඩංගු කාබොහයිඩ්‍රේට් වර්ගයකි,
(1) පෙක්ටින් (2) ඉනියුලින් (3) ඇමයිලො පෙක්ටින් (4) ලිග්නින්

**2.** මේදවල කෘත්‍ය දෙකකි,
(1) එන්සයිම නිෂ්පාදනය සහ ප්‍රතිශක්තිය ලබා දීම
(2) ප්‍රතිශක්තිය ලබා දීම සහ ශක්තිය නිපදවීම
(3) එන්සයිම නිෂ්පාදනය සහ ශරීර උෂ්ණත්වය පාලනය කිරීම
(4) ශරීර උෂ්ණත්වය පාලනය කිරීම සහ ශක්තිය නිපදවීම

**3.** පහත දැක්වෙනුයේ ප්‍රෝටීන් හා සම්බන්ධ කරුණු කිහිපයකි. මින් සාවද්‍ය කරුණ කුමක් ද?
(1) එහි සංයුතියෙහි නයිට්‍රජන් අඩංගු ය. (2) අතිරික්තය අක්මාව තුළ ගබඩා කරයි.
(3) සත්ත්වමය ප්‍රෝටීන් ගුණාත්මක බවින් ඉහළ ය. (4) ශක්ති අගය ග්‍රෑම් එකකට කිලෝ කැලරි 4 කි.

**4.** විටමින් A වල කෘත්‍යයකි,
(1) කැල්සියම් අවශෝෂණය වේගවත් කිරීම (2) පැහැදිලි දෘෂ්ටිය ලබා දීම
(3) රුධිරය කැටි ගැසීමට උපකාරී වීම (4) පේශි තානය පාලනය කිරීම

**5.** පහත දැක්වෙනුයේ 'X' නමැති විටමිනය හා සම්බන්ධ කරුණු කිහිපයකි.
- ජල ද්‍රාව්‍ය වේ.
- ඔක්සිකරණයට භාජනය වේ.
- ප්‍රතිශක්තිය ලබා දේ.
- යකඩ අවශෝෂණයට උපකාරී වේ.

'X' විය හැක්කේ,
(1) විටමින් C ය. (2) විටමින් $B_1$ ය. (3) විටමින් $B_2$ ය. (4) විටමින් D ය.

**6.** බීටා කැරොටින් බහුලව අඩංගු ආහාර ද්‍රව්‍ය ඇතුළත් කාණ්ඩය මින් කුමක් ද?
(1) පේර, නෙල්ලි, අන්නාසි (2) බෝංචි, කෙසෙල්, අලිගැටපේර
(3) පිපිඤ්ඤා, කැරට්, රාබු (4) වට්ටක්කා, අඹ, පැපොල්

**7.** අස්ථි හා දත්වල මනා වර්ධනය සඳහා ක්‍රියා කරන පෝෂක දෙක වනුයේ,
(1) කැල්සියම් සහ විටමින් D ය. (2) ප්‍රෝටීන් සහ විටමින් A ය.
(3) මැග්නීසියම් සහ විටමින් E ය. (4) පොස්පරස් සහ විටමින් K ය.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**8.** වැඩිම ශක්ති අගයකින් යුත් ආහාර ද්‍රව්‍යය මින් කුමක් ද?
(1) කජු (2) සහල් (3) බටර් (4) බතල

**9.** මාෂබෝගවල අඩංගු ප්‍රෝටීනය වනුයේ,
(1) ලෙගියුමින් ය. (2) ග්ලූටන් ය. (3) ජෙලටින් ය. (4) කේසින් ය.

**10.** ආහාර සකස් කිරීමේ දී අනුගමනය කරන පුරුදු කිහිපයක් පහත දැක්වේ. මින් **වැරදි** පුරුද්ද වනුයේ,
(1) පිට පොත්ත සහිතව අල තැම්බීම ය. (2) ආහාර පිසින අතරතුර ලුණු එකතු කිරීම ය.
(3) කැපීමට පෙර එළවළු සේදීම ය. (4) පිසීමට පෙර මාළු පදම්කර තැබීම ය.

**11.** පහත සඳහන් ආහාර වේල් අතුරින් යකඩ, ප්‍රෝටීන් සහ විටමින් C බහුලව අඩංගු ආහාරවේල වනුයේ,
(1) ඉදිආප්ප, අල කරිය, සීනිසම්බල හා පලතුරු පානය ය.
(2) ආප්ප, පරිප්පු කරිය, ලුනු සම්බල හා කහට තේ ය.
(3) කිරිබත්, කට්ටසම්බල, කිරිහොදි හා කිරිකෝපි ය.
(4) පාන්, මාළු කරිය, කෙසෙල් හා කොළකැඳ ය.

**12.** තැටියේ පිළිස්සීමෙන් පිසගනු ලබන ආහාරයකි,
(1) බිත්තර (2) අල (3) රොටි (4) කරවල

**13.** ආහාරමය තන්තුවල කෘත්‍යයකි,
(1) මලපහවීම පහසු කිරීම (2) පෝෂක අවශෝෂණය වේගවත් කිරීම
(3) ආහාර ජීර්ණයට උපකාරී වීම (4) එන්සයිම නිෂ්පාදනය වැඩි කිරීම

**14.** මාලු ඇඹුල් තියල් සෑදීමේ දී සිදු **නොවන** ක්‍රියාවකි,
(1) සාන්ද්‍රණය වැඩිවීම (2) pH අගය වැඩිවීම (3) බාහිරාසෘතිය (4) ජල සක්‍රියතාව අඩුවීම

**15.** ආහාර නරක්වීමට හේතුවන බාහිර සාධකයකි,
(1) උපස්තරය (2) එන්සයිමීය ක්‍රියා (3) pH අගය (4) ඔක්සිජන්

**16.** පහත දැක්වෙනුයේ ඌනතා රෝග හා සම්බන්ධ රෝග ලක්ෂණ කිහිපයකි. මින් නිවැරදි වනුයේ කුමක් ද?
(1) යකඩ ඌනතාවයේ දී තුවාල දැකිය හැකි ය.
(2) විටමින් A ඌනතාවයේ දී පාද හිරි වැටීම පෙන්නුම් කරයි.
(3) ප්‍රෝටීන් ඌනතාවයේ දී ඉදිමාව ඇති වේ.
(4) විටමින් C ඌනතාවයේ දී මලබද්ධය දක්නට හැකි ය.

**17.** ඉතා සිහින් සිරුරක් දැකිය හැකි වනුයේ,
(1) අස්ථි විකෘති රෝගයේ දී ය. (2) බෙරි බෙරි රෝගයේ දී ය.
(3) මැරැස්මස් රෝගයේ දී ය. (4) නිරක්තයේ දී ය.

**18.** පූර්ව ප්‍රසව සංවර්ධනය හා සම්බන්ධ නිවැරදි වැකිය මින් කුමක් ද?
(1) ආර්තව චක්‍රයෙහි මුල් දින පහ තුළ ඩිම්බ මෝචනය සිදු වේ.
(2) ගර්භාෂයෙහි අධිරෝපණය වීමෙන් පසු යුක්තාණුව බෙදීම ආරම්භ වේ.
(3) මවගේ රුධිරයෙහි ඇති හානිකර ද්‍රව්‍ය භ්‍රෑණයට පරිවහනය වීම, කලල බන්ධය මගින් වළක්වයි.
(4) පූර්ව ප්‍රසව අවධියෙහි සති දෙකේ සිට මාස තුන දක්වා කාල සීමාව කලල අවධිය ලෙස හැඳින්වේ.

**19.** පරිණත ඩිම්බයක් මෝචනයෙන් පසු සාමාන්‍යයෙන් සජීවී ව පවතින්නේ,
(1) පැය 12ක් පමණි. (2) පැය 24ක් පමණි. (3) පැය 36ක් පමණි. (4) පැය 48ක් පමණි.

**20.** මාස 18 සම්පූර්ණ වූ විට දරුවාට ලබා දෙන එන්නත මගින් වළක්වන රෝගයකි,
(1) පෝලියෝ (2) රුබෙල්ලා
(3) ජපන් නිදිකර්පර ප්‍රදාහය (ජැපනීස් එන්සෙෆලයිටිස්) (4) සරම්ප

**21.** මුල් ළමාවිය දරුවකුගේ වර්ධනයෙහි දක්නට ලැබෙන ලක්ෂණයකි,
(1) වර්ධනය ළදරුවියට වඩා සීඝ්‍ර වීම
(2) අස්ථිභවනය ක්‍රමාණුකූලව සිදුවීම
(3) කඳ හා ගාත්‍රාවලට සාපේක්ෂව හිසෙහි වර්ධන වේගය වැඩි වීම
(4) දත් 25ක් පමණ මතු වීම

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**22.** දරුවන්ගේ කායික වර්ධනය කෙරෙහි බලපාන සාධකයක් **නොවනුයේ**,
(1) මේරීම ය. (2) ඉගෙනීම ය. (3) ආරය ය. (4) පරිසරය ය.

**23.** මුල් ළමාවිය දරුවකු පෙන්වන චර්යාමය ගැටලුවකි,
(1) වමත් හුරුව (2) අනුකරණය (3) කෝපාවේගය (4) ඊර්ෂ්‍යාව

**24.** සමහර දරුවන් තුළ දක්නට ලැබෙන ඇඟිලි ඉරීම මගහරවා ගැනීමට ගත හැකි පියවරකි,
(1) අන් අය සමග සසඳමින් ලැජ්ජා කිරීම. (2) සූප්පුවක් ඉරීමට අවස්ථාව ලබා දීම.
(3) දරුවාගේ අවධානය වෙනතකට යොමු කිරීම. (4) ඇඟිලිවල තිත්ත ද්‍රව්‍යයක් ආලේප කිරීම.

**25.** මුල් ළමාවිය දරුවන් සමාජයට පළමුව යොමුවීමේ දී පිළිබිඹු කරන ලක්ෂණයකි,
(1) ලැජ්ජාශීලීබව පෙන්වීම (2) ක්‍රීඩා භාණ්ඩ හුවමාරු කර ගැනීම
(3) කණ්ඩායම් තුළ සිටීමට ලැදි වීම (4) ඉතා ක්‍රියාශීලී වීම

**26.** මුල් ළමාවිය දරුවකුගේ ඇස අත සමායෝජනයට වඩාත් හිතකර ක්‍රියාකාරකම මින් කුමක් ද?
(1) නිදහස් චිත්‍ර ඇඳීම (2) කඩදාසි කැබලි ගුලි කිරීම
(3) මැටි ඇඹීම (4) බෝතල්වලට වතුර පිරවීම

**27.** යොවුන් දරුවන්ගේ සාමාන්‍ය ලක්ෂණයක් **නොවනුයේ**,
(1) කැපීපෙනීමට ඇති ආශාවයි. (2) කලහකාරී බවයි.
(3) විරුද්ධ ලිංගිකයින් කෙරෙහි ආකර්ෂණයයි. (4) ස්වාධීනත්වයට නැඹුරුවීමයි.

**28.** වාටි මැස්ම
(1) ආරම්භ කළ යුතු වන්නේ පිස්මේන්තු දෙකක් මැසීමෙනි.
(2) දකුණු කෙළවරින් ආරම්භ කර නූල අද්දර සඟවා ඇල හැඩයට මැසිය යුතු ය.
(3) අවසාන කළ යුතු වන්නේ ගැටයක් යෙදීමෙනි.
(4) පිස්මේන්තු දෙකක් නොපිටින් මසා අවසාන කළ යුතු ය.

**29.** පතරොම ඇසුරින් ළදරු ඇඳුමක් කපා ගැනීමේ දී සිසුවියක් අනුගමනය කළ පියවර කිහිපයක් පහත දැක් වේ. මෙහි **වැරදි** පියවරකි,
(1) පතරොමෙහි උස, රෙද්දේ බලවාටියට සමාන්තරව තැබීම
(2) පතරොම රෙද්ද මත තබා අල්පෙනෙත්ති ගැසීම
(3) පතරොම සමග රෙදි කොටස් කපා ඉවත් කිරීම
(4) කාබන් කඩදාසිය රෙද්ද හා පතරොම අතර තැබීම


**30.** සිහින් නූල් දුවවීම හා වාටි මැස්ම භාවිත කර මූට්ටුවක් මසා නිම කර ඇත. මෙම මූට්ටුව කුමක් ද?
(1) සරල මූට්ටුව (2) ප්‍රංශ මූට්ටුව (3) පැතලි මූට්ටුව (4) අතිච්ඡාදන මූට්ටුව

**31.** ආරෝපණ (ඇප්ලික්) කිරීමට මෙන් ම, විසිතුරු මැහුම් ක්‍රමයක් ලෙස ද භාවිත වන මැස්මකි,
(1) නැටි මැස්ම (2) බ්ලැන්කට් මැස්ම (3) බොත්තම් කාස මැස්ම (4) හුරුළුකටු මැස්ම

**32.** රිවි ඇඳුමෙහි අංශ විවරය පියවීම සඳහා යෝග්‍ය ක්‍රමය වනුයේ,
(1) හක් සහ මුදු ඇල්ලීම ය. (2) බොත්තම් ඇල්ලීම ය.
(3) සැනගාංචුවක් ඇල්ලීම ය. (4) දෙපෙති ජන්තු ඇල්ලීම ය.

**33.** ඇඳුමක පළමු සේදීමෙන් පසු එහි හැකිළීමක් දක්නට ලැබුණි. මීට හේතුව වනුයේ ඇඳුම කැපීමට පෙර,
(1) රෙද්දෙහි ඇද කපා ඉවත් නොකිරීම ය. (2) රෙද්ද මැදීමට භාජනය නොකිරීම ය.
(3) රෙද්ද විකර්ණය ඔස්සේ නොඇදීම ය. (4) රෙද්ද ජලයෙහි පොඟවා නොතැබීම ය.

**34.** මෙම රූප සටහනින් පෙන්නුම් කරනුයේ,



(1) බයින්ඩින් කිරීමකි.
(2) පෝරු වාටියකි.
(3) පයිපින් කිරීමකි.
(4) හැඩපෝරු වාටියකි.

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**35.** පහත දැක්වෙන ඇඳුම් පන්න අතුරින් අවුරුද්දක් වයසැති ගැහැණු දරුවකු සඳහා වඩාත් යෝග්‍ය වනුයේ,
(1) බෝරිච්චි අත් සහ කරපටිය සහිත කපු ඇඳුමකි.
(2) ලිහිල් අත් සහ කරපටිය සහිත නයිලෝන් ඇඳුමකි.
(3) පිටුපස ඉන දක්වා උරහිස් පටි යෙදූ ලිනන් ඇඳුමකි.
(4) අත්කට සහ කරවටා රැළිපටි සහිත රෙයෝන් ඇඳුමකි.

**36.** ගෘහීය සම්පත් වර්ගීකරණයේ දී භෞතික නොවන සම්පතක් වනුයේ,
(1) ඉන්ධන ය. (2) කාලය ය. (3) ඉඩකඩ ය. (4) ජලය ය.

**37.** කාමරයකට ස්වාභාවික ආලෝකය ලබාදීම සඳහා වඩාත් සුදුසු වන්නේ මින් කුමක් ද?
(1) වහලයෙහි විනිවිද පෙනෙන ෂීට් යෙදීම (2) බිත්තියකට කන්නාඩියක් තැබීම
(3) වහලේ හැඩයට සිවිලිම යෙදීම (4) බිත්තිවල උස ප්‍රමාණය වැඩි කිරීම

**38.** නිවෙස් කිහිපයක් නිරීක්ෂණය කිරීමෙන් පසු සිසුන් ඉදිරිපත් කළ කරුණු සමහරක් පහත දැක්වේ. මින් නිවැරදි කරුණ කුමක් ද?
(1) විසිත්ත කාමර සඳහා උසින් වැඩි ජනේල යෙදීම
(2) නිදන කාමරයෙහි දොර කෑම කාමරයට විවෘත වීම
(3) විසිත්ත කාමර ජනේල සඳහා පාරභාෂක වීදුරු යෙදීම
(4) කුෂන් කරන ලද පුටු කිහිපයක් ආලින්දයෙහි තැබීම

**39.** කාල කළමනාකරණය හා සම්බන්ධ **නොවන** ප්‍රකාශය මින් කුමක් ද?
(1) එක් කාර්යයක් කරන අතරතුර තවත් කාර්යයක නියැළීම
(2) පවුලේ සාමාජිකයින් අතර කාර්ය බෙදා දීම
(3) වැඩ පහසු කරන උපකරණ යොදා ගැනීම
(4) පවුලේ සාමාජිකයින්ගේ කැමැත්ත අනුව කාලය වෙන් කර දීම

**40.** නිවසක උපාංග ස්ථානගත කිරීම හා සම්බන්ධ නිවැරදි වැකිය මින් කුමක් ද?
(1) උසින් අඩු උපාංගයක් තරප්පු පෙළ අසල තබා ඇත.
(2) වියළි මල් සැකසුමක් අඳුරු මුල්ලකට යෝග්‍ය ය.
(3) විශාල පින්තූරයක් විසිත්ත කාමරයේ කෙළවරක තැබීමට සුදුසු ය.
(4) කෑම මේසය මත තැබීමට සුවඳ විහිදෙන මල් සහිත සැකසුමක් තෝරා ගෙන ඇත.

* *

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

85 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ගෘහ ආර්ථික විද්‍යාව I, II
மனைப் பொருளியல் I, II
Home Economics I, II

## ගෘහ ආර්ථික විද්‍යාව II

* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

මනාව සංවිධානය කර ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක, දරුවන්ගේ සංවර්ධනයට ඉවහල් වන සේ විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. පෙ.ව. 10.00 ට පමණ ගනු ලබන ආහාරවේල ද මධ්‍යස්ථානය මගින් දරුවනට ලබා දේ. මෙහි දී දරුවන්ගේ විශේෂ පෝෂණ අවශ්‍යතා සහ ආහාරවේල්වල සුරක්ෂිත බව කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

මෙම මධ්‍යස්ථානය මගින් එක් දින චාරිකාවක් සඳහා උද්‍යානයක් නැරඹීමට යාමට තීරණය කර ඇත.

(i) මුල් ළමාවිය දරුවන්ගේ විශේෂ පෝෂණ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.

(ii) පෙ.ව. 10 ට පමණ ලබා දෙන ආහාරවේලෙහි සුරක්ෂිතතාව සඳහා මධ්‍යස්ථානය මගින් ගෙන ඇති පියවර **හතරක්** ලියන්න.

(iii) මුල් ළමාවිය දරුවන් ප්‍රිය කරන අතුරුපස වර්ග දෙකකි, කැරමල් පුඩිම සහ වටලප්පන්. මෙම ආහාර වර්ග දෙක පිළියෙල කිරීමට අවශ්‍ය ප්‍රධාන ද්‍රව්‍ය **දෙක** බැගින් සඳහන් කරන්න.

(iv) චාරිකාව නිම වී ආපසු එනවිට සවස තේ පානය සඳහා බස් රථය තුළ දී ගැනීමට සුදුසු බොජුන් පතක් ලියන්න.

(v) දරුවන්ගේ නිල ඇඳුම සඳහා කපු රෙදි තෝරා ගෙන ඇත. එයට හේතුවන කරුණු **දෙකක්** ලියන්න.

(vi) දරුවන්ගේ නිල ඇඳුම් කට්ටලය නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් වී ඇති කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(vii) දරුවන්ගේ බාහිර ක්‍රීඩා සඳහා විවිධ උපකරණ මෙම මධ්‍යස්ථානයෙහි නිර්මාණය කර ඇත. එවැනි උපකරණ **දෙකක්** නම් කරන්න.

(viii) උද්‍යානය නැරඹීමෙන් දරුවන්ට ලබා ගත හැකි පාරිසරික අත්දැකීම් **දෙකක්** සඳහන් කරන්න.

(ix) මෙවැනි මධ්‍යස්ථානයක ගොඩනැගිලි නිර්මාණය කිරීමේ දී මනා වාතාශ්‍රය ලබා ගැනීමට ගත යුතු පියවර **හතරක්** දක්වන්න.

(x) පන්ති කාමර තුළ, දරුවන් සඳහා ගෘහභාණ්ඩ සංවිධානය කිරීමේ දී අවධාරණය යොමු කළ යුතු කරුණු **හතරක්** ලියන්න.

**2.** (i) ළදරු ඇඳුමක් (baby shirt) අලංකාර කිරීම සඳහා සුදුසු එම්බ්‍රොයිඩර් මෝස්තරයක් අඳින්න.

(ii) මෙම ළදරු ඇඳුමෙහි කර සහ අත්කට මසා නිමකර ගත හැකි ක්‍රම **තුනක්** ලියන්න.

(iii) රිවි ඇඳුමක කකුල වටා මසා නිම කිරීම සඳහා පෝරුවාටියක් හෝ හැඩපෝරු වාටියක් යෙදිය හැකි ය. මින් එක් ක්‍රමයකට අදාළ ව

(a) පටි සකස් කර ගැනීමේ දී

(b) රිවි ඇඳුමේ කකුල වටා මසා නිම කිරීමේ දී

අනුගමනය කරන ක්‍රියාවලිය විස්තර කරන්න.

[හැරවීම පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**3.** (i) (a) ආහාර පිරමීඩයෙහි පහළින් ම ඇති කොටසෙහි අඩංගු ආහාර ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.
(b) මෙම ආහාර ද්‍රව්‍යවල අඩංගු ප්‍රධාන පෝෂ්‍ය පදාර්ථයෙහි කෘත්‍ය **දෙකක්** සඳහන් කරන්න.
(ii) සිරුර තුළ ජලයෙන් ඉටුවන කෘත්‍ය **තුනක්** ලියන්න.
(iii) (a) පහත සඳහන් ආහාර වර්ග සකස් කිරීමේ දී භාවිත වන පිසීමේ ක්‍රම පිළිවෙළින් නම් කරන්න.
- ඉඳි ආප්ප
- කොකිස්
- මාළුපාන්

(b) ඉහත (a) හි සඳහන් කළ ක්‍රමවලින් **එක්** පිසීමේ ක්‍රමයක් පැහැදිලි කරන්න.

**4.** (i) 'ඌනතා රෝගය' යන්න හඳුන්වන්න.
(ii) නිරක්තය ශ්‍රී ලංකාවේ පවතින පෝෂණ ගැටලුවකි. මෙම රෝග තත්ත්වයට හේතුවන කරුණු **තුනක්** පැහැදිලි කරන්න.
(iii) "යොවුන් දරුවෝ බොහෝවිට අහිතකර ආහාර රටා අනුගමනය කරති." සාකච්ඡා කරන්න.

**5.** (i) 'විස්තෘත පවුල' හඳුන්වන්න.
(ii) පවුලක ජීවන චක්‍රයේ අවධි නම් කරන්න. ඉන් එක් අවධියක් පැහැදිලි කරන්න.
(iii) "නිවසක භෞතික සංවිධානයේ දී කාමරවල පිහිටීම පිළිබඳව සැලකිලිමත් වීම වැදගත් වේ." සාකච්ඡා කරන්න.

**6.** (i) දරුවාට මාස 2, 4 සහ 6 අවසානයේ දී දෙනු ලබන පංච සංයුජ එන්නත මගින් වළක්වන රෝග නම් කරන්න.
(ii) මුල් ළමාවියෙහි පසුවන සමහර දරුවන් රාත්‍රියේ දී 'ඇඳ තෙමීම' සිදු කරයි. මෙයට හේතුවිය හැකි කරුණු **තුනක්** පැහැදිලි කරන්න.
(iii) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් මගින් දරුවන්ගේ බුද්ධි වර්ධනය සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් **හතරක්** විස්තර කරන්න.

**7.** (i) සටහන් ලියන්න.
(a) යුක්තානුව
(b) කලලාවාරික කෝෂය

(ii) යොවුන් දරුවන්ගේ සමාජ වර්ධනය සඳහා පාසල දායකවන අයුරු පැහැදිලි කරන්න.
(iii) "යෞවනෝදයෙහි දී ඇති වන විවිධ වෙනස්වීම් සමහර දරුවන් තුළ ගැටලුමය තත්ත්ව උදා කරයි." උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

❊ ❊ ❊

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/